# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 263 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 13/02/2024 පැය 1905

# මාධ්‍ය නිවේදනය

## විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් පළ වූ පුවතක් සම්බන්ධව කරුණු පැහැදිලි කිරීම.

අවිගත් අපරාධකරුවන් දෙදෙනෙකු විසින් මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයට 12 වැනිදා අලුයම කඩාවැදී කොල්ලකෑමක් සිදු කර ඇති බවත්, එහි ආරක්ෂාවට යොදවා සිටි ආර්ථික මධ්‍යස්ථාන පොලිස් මුරපොළෙහි නිලධාරීන් තිදෙනා අගමැතිතුමා මීගොඩ ප්‍රදේශයට පැමිණීමට අදාළව විශේෂ රාජකාරි යොදවා සිටි බැවින් නින්දේ පසුව ඇති බවට පුවත් මඟින් පළ කර ඇත.

2024.02.11 වන දින මීගෙඩ ප්‍රදේශයට ගරු අගමැතිතුමා පැමිණීමට අදාළ විශේෂ රාජකාරි සඳහා ආර්ථික මධ්‍යස්ථාන පොලිස් මුරපොලේ රාජකාරි නියුතු නිලධාරීන් තිදෙනෙකු 2024.02.11 වන දින පෙරවරුවේ පැය 02 ක පමණ කාලයක් එම විශේෂ රාජකාරි සඳහා යොදවා සිට ඇති අතර, එම නිලධාරීන්ගෙන් එක් නිලධාරියකු පමණක් රාජකාරි සඳහා පිටව ගොස් ඇත. අනෙක් නිලධාරීන් දෙදෙනා හදිසි අවස්ථාවකදී කැඳවීමට මීගොඩ පොලිස් ස්ථානයේ පොරොත්තු රාජකාරි යොදවා ඇත. ඒ අනුව එම නිලධාරීන් දෙදෙනා මීගොඩ පොලිස් ස්ථානයේ රැඳී සිට ඇති අතර එම රාජකාරිය අවසන් වීමෙන් පසු මෙම නිලධාරීන් නියමිත පරිදි ආර්ථික මධ්‍යස්ථානයේ ආරක්ෂක රාජකාරි යෙදිය යුතුව ඇති බවට ස්ථානාධිපති මීගොඩ විසින් වාර්තා කර ඇත.

මෙම ආර්ථික මධ්‍යස්ථාන පොලිස් මුරපොළේ නිලධාරීන් ගරු අගමැතිතුමා පැමිණීමට අදාළ විශේෂ රාජකාරි යොදවා ඇත්තේ 11 වන දින දිවා කාලයේ වන අතර මෙම කොල්ලකෑම 12 වන දින අලුයම් කාලයේදී සිදුව ඇත.

ඒ අනුව මෙම නිලධාරීන් මෙම ස්ථානයේ ආරක්ෂක රාජකාරි යෙදී නොසිටීමෙන් රාජකාරි පැහැර හැර ඇති බව නිරීක්ෂණය වේ. දැනට මෙම නිලධාරීන් මෙම පොලිස් මුරපොළෙන් වෙනත් ස්ථානයකට ස්ථානමාරු කර ඇති අතර රාජකාරි පැහැර හැරීම සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කර නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව ක්‍රියා කිරීමට කටයුතු කරනු ඇත.

ගරු අගමැති තුමා පැමිණීම හේතුවෙන් නිලධාරීන් විශේෂ රාජකාරි යෙදවීමෙන් මෙම ආර්ථික මධ්‍යස්ථානයේ ආරක්ෂාවට යොදවා සිටි පොලිස් මුරපොලෙහි නිලධාරීන්ගේ රාජකාරි සඳහා කිසිදු බලපෑමක් සිදුව නොමැති බවට වැඩිදුරටත් අවධාරණය කරමි.

පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,
පොලිස් මාධ්‍ය කොට්ඨාසය